

# THE FIRST PICK OF THE SPRING BLOOM

The first pick of the spring bloom
Of my stunning rose bed
Is for thee, my love.
May the roses –red roses-
Push out from their buds
In one riot of colour
To show their glory
Before they fall.
From time to time
I shall pluck them
And place upon thy tomb.
For such precious beauty
Evanescent though
A better resting
I'll never know.
Ever!-

Shyamon

## අකුණු



කළු ම අඳුරුම උදයක
දෙබෑ කර නුබ තලයම
දිලිසුණා එක අකුණක්
රුදු රිදී ඉරි තැල්මක්

අමතකව ගිය මතකෙක
රිදෙන කඩතොළු නුඹ මට

මලිති විජේසේකර

## කී කවි පසුගිය දොහේක - නතර වුනා සුසුම් සමග

| | |
|---|---|
| තාත්තා ලෙඩ වුනා කියලා දරුවො සැමදෙන | දුක්වුනා |
| දෙස් විදෙස් දරුවන් ඇවිත් හැමදෙනා එකටෙක | ලංවුනා |
| රෝහලේ සිටි වෙදදුරන් හෙද සොයුරියන් හැමසිත් | දිනා |
| හුස්ම ගැනුමට යන්ත්‍රයක් විත් තාත්තා හට එක් | වුනා |
| | |
| දින දෙකක් බරපතල විදිහට තාත්තා ඔත්පල | වුනා |
| නොසිතු විදිහට සැවොම සනසා අමාරුව යළි සුව | වුනා |
| නිතර ආගිය අය සමග වැඩි කතා බහකට | යෙමුවුනා |
| සතර දවසෙන් සුසුම නැවතත් යන්තරේටම නතු | වුනා |
| | |
| දවල් වෙනතුරු වෙදැදුරන් ලොකු මෙහෙවරකි කලබල | වෙලා |
| සියල්ලට පණිවිඩය ඇවිදින්, ගිහින් ඇද වට ගොනු | වෙලා |
| තාත්තා සටනක යෙදෙන හැටි බල බලා සුසුමන් | හෙලා |
| පිරිස එළියට පැමිණුනා දහවල් වෙලාවත් එක පහු | වෙලා |
| | |
| තදින් රෝගාතුර වෙලා ඇති ලෙඩුන් දැඩි | සත්කාරයේ |
| තාත්තට ඒ තැන සුදුසු බව දොස්තරට තේරුම් | ගියේ |
| ඔහුගෙ ණියමෙන් එතැන රදවන බවට අදහස් විය | පැයේ |
| සැවොම සැකමුසු දුකින් බරවයි හැරී නිවසට | පැමිණියේ |
| | |
| කවුරු කවුරුත් නොමැති තැන සුසුමට සුදුසු තැන | නැතිවෙලා |
| තඹුරු ඇස් යළි නොහැර සදහට දෙනෙත් යුග | අඩවන්වෙලා |
| සුසුම නැවතී දෙඅත් පහළට ඇදී ගොස් දරදඬු | වෙලා |
| අනූ එක් වස ආයු නවතා තාත්තගෙ පණ නැති | වෙලා |
| | |
| ලැබුණු පණිවිඩයට දුකින් වැළපෙමින් දරුවන් | හැඬුවදෝ |
| තවත් දවසක් ජීවිතේ තුල නොසිටිනා බව | දැනුනදෝ |
| අපේ කවුරුත් ළඟින් ඇත්දැයි කියා වටපිට | බැලුවදෝ |
| යලිත් දවසක තාත්තේ, යැයි කියා අමතනු | කාටදෝ |

සනත් පීරිස්,
"දයා සෙවන" තලාවිටිය, පරකඩුව, ශ්‍රී ලංකාව

## තේ රොඩු



තද කහට තේ පාට
වකගැසුණු දෙකම්මුල
ගිලුණු ඇස් ඇතුලෙ අග
දුක පිරුන කඳුළු බිඳ
වේලිච්ච තේ ගහක්
වගේ අත් කකුල් දෙක
විදුලි වේගෙන් දුවයි
පැලුණු කළු ඇඟිලි තුඩ
පාන්දර ඇඟිලි
ගල්වෙලා සීතලට තද
උණු අපදියෙන් දොවාකඩයි
දළු තුඩින් තුඩ
හිස පැලෙන අව්ව යට
දහඩියේ සිහිල් පොද
දිරපු තේ කොලය සේ
ඉලිප්පෙයි නහර අත

සංසාරේ පව් කූඩෙ
එල්ලගෙන පිට උඩට
මිටෙන් මිට දළු කඩා
අදී බර කරුම දුක
කාණුවට බසී
ලොක්කන්ට දී පාරෙ ඉඩ
සාරය උරා බීල
විසිකරපු තේ රොඩ්ඩ
නිවන් දකිනට ලගයි
සන්දනම් අම්මෙ නුඹ

අතුල විජේවික්‍රම

## මියගිය "රස්තියාදු" මිතුරාට

භාතිෂ අකලංක සිල්වා

ටයි කෝට් ඇඳන් උඹ වැතිරිලා හිටිය, සීරුවට
අත්තම්ම විතරක් මිදුලෙ, අඩ අඩා හිටිය හීනියට
මළගෙදර පහුකරන් ආපු මම හැරුණා මහ වීදියට
ඉස්සර දවස් මතක් කරන්න වාගෙ,
තරුත් පායල තිබුණා අහසෙ පේලියට

"මිතුර නුඹ වෙන්වුණේ හිතාගන්නත් බැරි විදියට"

ඉස්කෝලෙ කට් කරපු දවසක හෙමිහිට
සාක්කුවෙ ඔබාගෙන දෙකට නවපු පොත් ටික
දුව ගියේ, රට සල්ලි හොයාගෙන උඹ වැල්ලට
පිට්ටනියේ පයිප්පෙන් වතුර බී බඩගින්නට

හුළඟ එන අතට හැරි හැරී නැටු කෙහෙරැල්ල
කංස කූරක පහස හුරු පුරුදු හසරැල්ල
තරහ ගිය හැම විටක එසවුණා මැදගිල්ල
තාම මතකයි උඹට තිබුණු ඒ දැගලිල්ල

ඇහුව හැම එකාගෙම මුවේ මදහාස නැංවුව
එදා රෑ අර නාකි සුද්දිවත් ළට කැන්දුව
තවම ඇහෙනව වගෙයි, බොංගෝ නාදයක රැන්දුව
කැඩුණු ජර්මන් වලින් උඹ කියපු ඒ සිංදුව

පෝස්ටර් ගැහුව, ජන්දේ කාලෙට පිට පිට
පාට මොක වුනත්, ඒක රුපියල් දාහෙ කුලියට
කුණුහරුප කියාගෙන බැනල එලෙව්වත් ඉඳ හිට
ප්ලේන්ටිත් අරන් දුන්න උඹ, ඉස්ටේසම ළඟ හිටපු
පිස්සිට

ලජීවිතේ කොහොමද?ල කියල කවුරුහරි ඇහුවම
මහපට ඇඟිලි උස්සල "එල කිරි" යි කී ලස්සන
නෑ බෑ නොකිය, ඕනෙ වැඩකට අත ඉස්සුන
කාටවත් බෑ පුරවන්න නම් උඹෙ හිස්තැන

උඹ ගැන කියන්නට මේ තරු එළිය මදී
දෑසින් කඳුළු කැට මතුවෙයි පපුව රිදී
බැණ බැණ හිටියමුත් ආගමකට නොබැඳී
මට සහතිකයි, උඹ ගිය තැන හොඳට ඉඳී

Boondi.lk

## පහන් වැට






## අරුමයකි මේ

| | |
|---|---|
| පැද්දෙමින් නැළවෙමින් එකිනෙකා | පරයමින් |
| නංවමින් හීනියට පොඩි සුමුදු පෙණ | කැදලි |
| හාදු දී ආදරෙන් වෙරළ සිඹ යෙ | ලැසි |
| අරුමයකි සොබා දම් රලු පරළු මේ | රළගෙඩි |

ප්‍රසාදිනි වෙත්තසිංහ
මිල්පාක්